සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 S

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

සිංහල සාහිත්‍ය රසාස්වාදය
இலக்கிய நயம் சிங்களம்
Appreciation of Sinhala Literary Texts

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

* I කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකකටත්** උත්තර සපයන්න.

## I කොටස

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒ එක එකක් පිළිබඳ ව අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි උත්තර** ලියන්න.

(i) "හැයි තිට අත් පා නැද්ද? තොමෝත් ගසට නැඟී දිඹුල් කඩා ගෙනැ කා'යි කී හ."
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි 'තිට' යනුවෙන් ආමන්ත්‍රණය කෙරෙන්නේ කාට ද?

(ii) "යම් තෙනකට එක් වරක් ගිය කෙනෙක් නොඑද්ද එතැනැ යැ'යි කීහ."
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් අතුරු කතාවේ නම කුමක් ද?

(iii) "නුඹ වහන්සේ විසින් රට යුක්තිය යහපත් කොටැ පසිඳනා ලදැ'යි"
(අ) මෙම ප්‍රකාශයේ සඳහන් නුඹ වහන්සේ යනු කවුරු ද?
(ආ) මෙහි ඇතුළත් 'පසිඳනා ලදැ'යි' යන වචනයේ තේරුම ලියන්න.

(iv) "හසළ පස් දහරේ
කිසි දොස් නොවැකි සිරුරේ
යනෙන තිති එපුරේ
තුරඟ සෙන් වැනි තරඟ සයුරේ"
(අ) මෙම කවිය ඇතුළත් වන ග්‍රන්ථය කුමක් ද?
(ආ) මෙහි දැක්වෙන උපමාව වෙන් කර ලියන්න.

(v) "අවරට ගිය හිරු දෙවි තෙම
උණුසුම ගෙන දෙන අවියෙන්
සැඟවී සිටිය ද නො දනිමි මොහුගෙ පාමුලේ"
(අ) ඉහත කවිය ඇතුළත් කවි පන්තිය රචනා කළ රචකයා නම් කරන්න.
(ආ) මෙහි ඇතුළත් 'අවරට ගිය' යන වචනයෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?

(ලකුණු 04 × 5 = 20 යි.)

**2.** පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස්වල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල අර්ථය පළමු ව වෙන් වෙන් ව ලියා, එක් එක් පාඨයෙහි සමස්ත අර්ථය ද ලිහිල් බසින් ලියන්න.

(i) "තෙපි **දිය කෙළැ** ඇස ඔළිඳැට සේ රත් කොටැ, තෙත් හිසකේ ඇති වැ අඳනා ලද **තෙත් පිළී** ඇති වැ"

(ii) "රජ්ජුරුවෝ වනාහි රාජ මානයෙන් ද **ඉසුරු මදයෙන්** ද මත්වැ, **දංඩෙකින් පහරන ලද** සර්ප රාජයකු සේ කෝපයෙන් දිළිහී"

(iii) "**සුරසිරි** මෙන් නොමඳ
රජසිරි **යෙහෙන්** විඳ විඳ
ඔවුනොවුන් පෙම් බැඳ
මෙසේ එරජුන් රජ කරන සඳ"

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

(iv) "දෙදහස් වසක සිට අප සතුව පැවතිය
**නිදහස් කිරුළ** අද සතුරන්ට අයිතිය
**උදහස්** බව නිසා සිය දනගෙ විමතිය
නිදහස් බව නසාගති සිහළ ජාතිය"

(v) "ඉස සිට **කඩමලු රෙද්දක්** පොරවා
අතපය අකුළා නිදියෙයි ගොරවා
නැඟිටුව මේ මොකදැයි ඇහැ අරවා
දැමුවොත් සැරවෙයි තරහෙන් **ඔරවා**"

(ලකුණු 05 × 5 = 25 යි.)

## II කොටස

● පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක කොටසකට පමණක්** උත්තර සපයන්න.

**3.** මගේ රක්ෂාවේ වගකීම මහත්මයාගේ බංගලාව අසල මල් පාත්ති හොඳින් බලා ගැනීමත්, මහත්මයාට අවශ්‍ය දේවල් නගරයට ගොස් ගෙන ඒමත් හා නිතර මහත්මයා සමග කාර් එකේ එහෙ මෙහෙ යාමත් ය. ඒ කාලයේදී මට නින්දට පෙර රාත්‍රියට ගෙදර අය මතක් වේ. විදානෙලා අප්පච්චිලාට කරදර කරනවා ද? සිරා අනවශ්‍ය කවි සිපද කියනවා ද? නැත්නම් අම්මට උපාසකී බනිනවා ද? මාස ගණන් යන විට මට ගෙදර ගැන හැඟීම් වෙනස් විය. මෙයට හේතුව අම්මාගේ හිත ප්‍රීතිමත්ව තිබීමයි. අප්පච්චි කවදත් පුරුදු ලෙස වෙලේ හේනේ වැඩ කටයුතු කළේය. විදානේ මාමාත් අළුතක සිට වැව් ලේකම් මහත්මයාගෙන් කරදර විඳිමින් කටයුතු කරයි. අම්මා නම් වෙනදාට වඩා ආඩම්බරයෙන් වැවේ නාන වෙලාවට ආණ්ඩුවේ රක්ෂාව ගැන කථා කරනවාලු. මගේ රක්ෂාව ගැන අපට හිතවත් විදානේ මාමාගේ පවුලත්, සෝමරත්නලාගේ අම්මාත්, ඉස්කෝලේ ලොකු මහත්මයාත් සන්තෝෂය ප්‍රකාශ කළා ලු. "අට පාස් වුනා විතරයි ජ්‍යෙෂ්ඨයට ඉගෙනගන්න ඔය ළමයාට තනියෙන් කර ගන්න පුළුවන්. පස්සේ ගමින් පිටවුනාම දැනට ඔන්න ඔහෙ රක්ෂාවක් මොකක් හරි කරන එක හොඳයි." මේ ඉස්කෝලේ ලොකු මහත්මයා කී දෙයයි. අනිත් අතින් උපාසකී දවසක් පන්සලේ දී අම්මාට ඇනුම් පද කීවාලු. "දැන් තොපි ඉස්සෙල්ල හිටියටත් වඩා උඩ පනිනවා මන් දන්නවා." මාසේ අන්තිමේදී දිනක් මහත්මයා යාපනේ ගිය ඉරිදා දවසක අවසර ගෙන මම ගෙදර ගියෙමි.

අම්මාට පොඩි බුදු පිළිමයකුත්, අප්පච්චීට සරමකුත්, විදානේ මාමාට ලේන්සුවකුත් ගෙන ගොස් දුනිමි. පවුලේ නංගිලා මල්ලිලා සිටියා නම් ඔවුන්ට ද යමක් ගෙන ගොස් දීමට පුළුවන්කමක් තිබුණි. එහෙත් එවැනි වාසනාවක් මට නැත. සෝමරත්නලාගේ තාත්තටත් ලබන මාසේ පඩියෙන් යමක් අරන් දෙන්න සිතුවෙමි. "

(i) මෙම ගද්‍ය පාඨයෙහි සමස්ත අදහස පේළි **හතරකින්** පමණ ලියන්න.
(ii) මෙහි සඳහන් වන අන්දමට මගේ (තිලකරත්නගේ ) රක්ෂාවට අදාළ වගකීම් මොනවා ද?
(iii) මගේ (තිලකරත්නගේ) රක්ෂාව ගැන සන්තෝෂය ප්‍රකාශ කළේ කවුරුන් ද?
(iv) උපාසකී කියූ ඇනුම්පදවල අන්තර්ගත ප්‍රධාන කරුණු **දෙකක්** ලියන්න.
(v) මෙහි "එවැනි වාසනාවක් මට නැත" යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ එදා
වැටුණේ ජලය මැද සමුදුරයේ බිළි ඇදා
දැනුණේ කරපු විරිය ගොඩ ගන්ට එදා
හිමි රජුනේ මඟ ඇරියේ මන්ද මෙදා

රුවැති පුතුන් වැදුවා මම වැරදී ද
රුව ගුණ තේජසක් මගෙ අඩු වුණා ව ද
ගරුසරු නැතිකමක් මාතින් යෙදුණා ද
මරු බිඳ බුදු වෙන්න සිතෙන් පෙනුණා ද

සුවඳ බොජුන් වැළඳූ මගෙ හිමි සඳට
නිබඳ බොජුන් රස කර දුන් වළඳන්ට
සුවඳ පලාපල වැවියන් හිමියන්ට
සුවඳ මල් නිතර පිපියන් රන්කඳට

[තුන්වැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

(i) මෙම පද්‍ය පන්තියේ වස්තු විෂය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) මෙම පද්‍ය පන්තියේ දැක්වෙන ආකාරයට "උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ එදා" යන්නෙන් සංකේතවත් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(iii) පහත සඳහන් යෙදුම්වල අදහස ලියන්න.

(අ) වීරිය

(ආ) ගරුසරු නැතිකමක්

(ඉ) මරු බිඳ බුදු වෙන්න

(ඊ) බොජුන්

(උ) සුවඳ පලාපල

(iv) කතුවරයා යොදා ගෙන ඇති සරල භාෂාව මෙම පද්‍ය පන්තියේ සාර්ථකත්වය කෙරෙහි බලපා ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 25 යි.)

## III කොටස

මෙම කොටසේ ප්‍රශ්න **දෙකකට** පමණක් උත්තර සපයන්න.
(එක් උත්තරයකට වචන **150**ක් වත් තිබිය යුතු ය.)

**4.** ගැටලු විසඳීමෙහිලා මහෞෂධ පඬිවරයාට තිබූ හැකියාව කාළගෝල ප්‍රශ්නය හෝ පුත්‍ර ප්‍රශ්නය යන අතුරු කතා දෙකෙන් **එක්** කතා පුවතක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

**5.** විශාලා මහනුවර පැවති සෞභාග්‍යය චිත්තරූප දැනවෙන ආකාරයෙන් අර්ථපූර්ණව ඉදිරිපත් කිරීමට බුදුගුණ අලංකාරය කතුවරයා දැක්වූ කුසලතාව නිදසුන් කවි **තුනක්වත්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**6.** නියඟය හා නිලධාරීන්ගේ අකටයුතුකම් රජරට මිනිසුන් පීඩාවට පත් කළ ආකාරය විවරණය කිරීමට 'පෙත්සම' නවකතා රචකයා දැරූ ප්‍රයත්නය අදාළ නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විමසන්න.

**7.** පාඨකයා තුළ දේශාභිමානී හැඟීම් දැනවීමට පී. බී. අල්විස් පෙරේරා දක්වන කුසලතාව 'මගේ රට' පද්‍ය පන්තියේ එන නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(එක් උත්තරයකට ලකුණු 15 බැගිනි.)

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka